www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඩුබායි ඝාතනය සහ 'ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය'

## The Dubai assassination and the "war on terror"

2010 මාර්තු 2

පසුගිය මාසයේ ඩුබායිහි දී සිදු වූ හමාස් සාමාජික මහ්මුද් අල්-මබෞගේ ඝාතනය පිලිබඳව ලොව පුරා ආන්ඩු දක්වා ඇති ප්‍රතිචාරය "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" යටතේ ජාත්‍යන්තර නීතියේ මූලික ප්‍රඥප්තීන් කොතරම් දුරට ඉරාදමනු ලැබ ඇද්දැයි පෙන්නුම් කරයි. එක්සත් ජනපද ආන්ඩුව සහ එහි සහචරයින් පිලිබඳව සලකන කල අධිකරන-බාහ්‍ය ඝාතන සහ ඊනියා ඉලක්ක ගත මරාදැමීම් මේ වනවිට නීත්‍යානුකූල රාජ්‍යමය කටයුත්තක් වන අතර හෙලාදැකීම පසෙක තැබුවත් අදහස් දැක්වීමක්වත් අවශ්‍ය නො වේ.

ඊස්රායල ආන්ඩුව මේ පිලිබඳ කිසිදු නියුක්ත වීමක් තහවුරු කරන්නේ හෝ ප්‍රතික්ෂේප කරන්නේ නැති නමුත් එහි රහස් තොරතුරු ඒජන්සිය වන මොසාඩ් ඩුබායි ක්‍රියාන්විතයට ඍජුව ම වගකිව යුතු යයි පුලුල්ව පිලිගැනේ. මෙම සිද්ධිය පිලිබඳව ඔබාමා පරිපාලනය අතිශයින් ම නිහඬව සිටින අතර බ්‍රිතාන්‍යය, ඕස්ට්‍රේලියාව, ප්‍රන්සය, ජර්මනිය සහ අයර්ලන්තය ඔවුන්ගේ ගමන් බලපත්‍ර ව්‍යාජ ලෙස සකස්කිරීම පිලිබඳව යන්තමින් රූපික විරුද්ධත්වයන් පලකලහ. කිසිවෙක් මබෞගේ ඝාතනය හෙලා දැක නැත.

මෙම ඝාතනය අවසාන කටයුත්ත දක්වා ම මනාව සංවිධිත කෲර ක්‍රියාදාමයකි. ඩුබායි පොලීසියට අනුව මබෞට සක්සිනිල්කෝලයින් නමැති පේශි සැහැල්ලුකාරක ඖෂධය එන්නත් කොට කොට්ටයකින් හුස්ම හිර කිරීම මගින් කූටයට පත් ලකලැහැස්ති වීමට පිරිමින් සහ ගැහැනුන් 27 දෙනෙක් හවුල් වී ඇත. වාර්තා වන ආකාරයට ඝාතනය ස්වාභාවික මරනයක් ලෙස පෙන්නුම් කිරීම සඳහා ඝාතකයෝ අධි රුධිර පීඩනයට ගන්නා ඖෂධ දමා, ඔවුන්ගේ ගොදුරේ හෝටල් කාමරයේ දොරේ "බාධා කරන්න එපා" යන්න සඳහන් කාඩ් පතක් එල්ලා මබෞගේ බිරිඳ ඇයගේ සැමියාට දුරකතනයෙන් කතා කිරීමට අපොහොසත්ව බලධාරීන්ට දැනුම් දීමට පෙර පලා ගියහ.

ලොව පුරා සිටින තම සතුරන්ව ලුහුබැඳීම සහ මරාදැමීම ගැන දිගු ඉතිහාසයකට හිමිකම් කියන ඊස්රායලය පසුගිය දශකය තුල බටහිර ඉවුරේ හා ගාසා තීරයේ පලස්තීන නායකත්වයට එරෙහිව ඝාතක මෙහෙයුමක් දියත් කොට ඇත.

මොසාඩ්හි නවතම අපරාධය අඩු හෝ වැඩි වසයෙන් වොෂින්ටනය සහ එහි සහචරයන් විසින් විවෘතව පිලිගනු ලැබීමට හේතුව වන්නේ ඒ හා සමාන විධික්‍රම දැන් "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ" කේන්ද්‍රීය සංරචකයක් වන නිසා ය. එක්සත් ජනපද රාජ්‍යයේ ආරක්ෂාවට තර්ජනයක් යයි හඳුනාලනු ලබන පුද්ගලයින්ව නඩු නොමැතිව අවිනිශ්චිත කාලයක් රඳවා ගනු ලැබීම සහ වධබන්ධනවලට ලක් කරනවා මෙන් ම ඇෆ්ගනිස්තානය, ඉරාකය, පකිස්තානය සහ යේමනය ඇතුලු රටවලදී ක්‍රමානුකූලව මරා දැමෙති. පකිස්තානය සහ මධ්‍යම ආසියාව තුල එක්සත් ජනපද මිලිටරි ක්‍රියාන්විත තීව්‍ර කිරීමට දුන් සිය උද්ඝෝෂන පොරොන්දුවට සත්‍යගරුක වී සිටින ජනාධිපති බැරැක් ඔබාමා ඇෆ්පාක් රංග භූමිය තුල තෝරාගත් ඉලක්කයන්ට අමතරව ලාක්ෂනිකව සිවිල් වැසියන් මරා දමන නියමුවන් රහිත ගුවන් ප්‍රහාරවලට අවසර දී ඇත.

එක්සත් ජනපද භටයෝ, රහස් තොරතුරු ක්‍රියාකාරිකයෝ සහ ඔවුන්ගේ සහචරයෝ භූමිය මතත් තම රටවල් වාඩිලාගැනීමට එරෙහිව සන්නද්ධ විරෝධතාවල නිරතව සිටින ඉරාක සහ ඇෆ්ගන් ජාතිකයින්ව නො කඩවා දඩයම් කිරීම සහ ඝාතනය කිරීම කරගෙන යති.

මධ්‍යම රහස් තොරතුරු ඒජන්සිය (සීඅයිඒ) සහ මොසාඩ් ද ඇතුලත් එහි සහචර රහස් තොරතුරු ඒජන්සිවලට ත්‍රස්තවාදී ක්‍රියාකාරකම්වල නියැලෙන්නේ යයි චෝදිත අයට එරෙහිව විනිසුරු, ජූරිය සහ මරාදමන්නා ලෙස ක්‍රියාකිරීමේ අයිතිය ඇතැයි යන්න දැන් ජාත්‍යන්තර පාලක කවතුල පිලිගැනීමට ලක්ව ඇති කාරනයකි. 1961 දී කොන්ගෝ නායක පැට්රික් ලුමුම්බා ඝාතනය කිරීම සහ කියුබානු ජනාධිපති ෆිදෙල් කස්ත්‍රෝ ඝාතනය කිරීමට උත්සාහ කිරීම ඇතුලු සීඅයිඒහි සීතල යුද කාලපරිච්ඡේදයේ මිනීමරු ක්‍රියාකාරකම් ජාත්‍යන්තර කෝපයක් අවුලුවාලීය. සීඅයිඒහි ජාත්‍යන්තර පරිමාන ඝාතන කුමන්ත්‍රන

හෙළිදරව්වීමෙන් අනතුරුව නැගී ආ මහජන විරුද්ධත්වයේ රැල්ලක් මධ්‍යයේ 1976 දී ජනාධිපති ජෙරල්ඩ් ෆෝඩ් ඍජුව ම ඝාතන ක්‍රියාවට දැමීමෙන් හෝ අනෙකුත් අයවලුන්ට කොන්ත්‍රාත් දීමෙන් සීඅයිඒ වලක්වමින් විධායක ආඥාවක් නිකුත් කලේ ය. එහෙත් දැන් "ඉලක්ක ගත ඝාතන" පිලිබඳව එවැනි සැකසංකා නොමැති අතර සීඅයිඒ සහ මිලිටරිය මත බලපවත්නේ අල්ප බාධාවන් පමනි. එක්සත් ජනපද ජාතික රහස් තොරතුරු අධ්‍යක්ෂ ඩෙනිස් බ්ලෙයාර් පසුගිය මාසයේ හෙළිදරව් කලේ ලොව පුරා සිටින ඇමරිකානුවන් ඝාතනය කිරීමට ඉඩදීමේ දී අර්ථ දක්වන ලද "පිලිවෙත් සහ නෛතික පටිපාටි" පවතින බවයි.

වොෂින්ටනය සමග පෙලගැසී සිටින සෑම ජාතික ආන්ඩුවක් ම සාපරාධී ය. බ්‍රිතාන්‍යය, ඕස්ට්‍රේලියාව, ප්‍රන්සය, ජර්මනිය සහ අයර්ලන්තය විසින් ඔවුන්ගේ ගමන් බලපත්‍ර දූර්භාවිතයේ යෙදීම අරබයා සනිටුහන් කරන ලද රාජ්‍ය තාන්ත්‍රික විරෝධතා විකාර රූපී ප්‍රෝඩාවක් පමනි.

මේ සඳහා යමෙක් කල යුතු වන්නේ ව්‍යාජ යුරෝපීය සහ ඕස්ට්‍රේලියානු ගමන් බලපත්‍ර භාවිතා කරමින් ඉරාන රහස් තොරතුරු ඒජන්තයින් වෙනත් රටක ඝාතනයක් සිදුකලේ නම් ප්‍රතික්‍රියාව කෙසේ වෙනස් වනු ඇද්ද යන ප්‍රශ්නය නැගීම පමනි. එසේ වුවහොත් එවිට රාජ්‍ය තාන්ත්‍රික රැඟුම් වෙනුවට පූර්න පරිමාන යුද්ධයක් සඳහා බෙර වැයෙනු ඇත.

මේ සමග සම්බන්ධව සිටින කිසිදු ජාතික ආන්ඩුවකට සිද්ධිය පිලිබඳව අගමැති බෙන්ජමින් නෙතන්යාහුගේ ඊස්රායල ආන්ඩුව ලුහුබැඳීමේ උවමනාවක් නැත. සියල්ලෝ සියොන්වාදී රාජ්‍යයේ යුද අපරාධවලට හවුල් ය. බ්‍රිතාන්‍යය, ඕස්ට්‍රේලියාව සහ ජර්මනිය හුදෙක් ඊස්රායලය ගාසාතීරයේ එල්ල කල ප්‍රහාරයේ දී යුද අපරාධ සිදුකල බවට ගෝල්ඩ්ටන් වාර්තාව කල සොයාගැනීම අනුමත කරමින් එක්සත් ජාතීන්ගේ මහා සම්මේලනය කල යෝජනාවට එරෙහිව පසුගිය නොවැම්බරයේ දී එක්සත් ජනපදය හා ඊස්රායලය සමග ඡන්දය භාවිතා කල රටවල් 16 අතර සිටියා පමනි. ඊට අමතරව යුද අපරාධ චෝදනා යටතේ ඊස්රායල විදේශ ඇමතිනී ට්සිපි ලිව්නි අත්අඩංගුවට ගැනීමේ ආඥාවක් පසුගිය වසරේ බ්‍රිතාන්‍ය උසාවියකින් නිකුත් කලවිට ඊස්රායල නිලධාරීන්ව ආවරනය වන බව තහවුරු කිරීම සඳහා අදාල නීතිය වෙනස් කිරීමට අගමැති ගෝඩන් බ්‍රවුන්ගේ ලේබර් ආන්ඩුව පොරොන්දු විය.

බ්‍රිතාන්‍ය ඩේලි මේල් පුවත් පතට අනුව "ආචාර සම්පන්න" ඊස්රායලය බ්‍රිතාන්‍ය ආන්ඩුවට කල්තබා අනතුරු ඇඟවීය. මෙම කතාව තහවුරු නො වී පවතින අතර අදාල අනෙකුත් රටවලටමෙන් ම එක්සත් ජනපදයට ද පූර්ව අනතුරු අඟවා තිබුනි ද යන ප්‍රශ්නය එමගින් ඉස්මතු කෙරේ.

ඒ කෙසේ වෙතත් ඩුබායි ඝාතනයට වගකිව යුතු අය ව්‍යාජ ගමන් බලපත් සකස්කල රටවල ආන්ඩු ඝාතන උද්ඝෝෂනයන් සමග සමීප ලෙස සම්බන්ධ ය යන්න පිලිබඳව සවිඥානිකය යන්න ගැන ඇත්තේ අල්ප සැකයකි. අගමැති ගෝඩන් බ්‍රවුන්ගේ ලේබර් ආන්ඩුව වසර ගනනාවක් තිස්සේ ඉරාකය තුල විස්තෘත ඉලක්ක ගත ඝාතන මෙහෙයුමක් අධීක්ෂනය කලේ ය. බීබීසී වාර්තාකාර මාක් උර්බන්ගේ නව ග්‍රන්ථයකට අනුව බ්‍රිතාන්‍ය තන්ත්‍රීය එස්ඒඑස් භටයෝ 350ත් 400ත් අතර "ත්‍රස්තවාදී" නායකයන් ඝාතනය කොට ඇත. අනෙකුත් එක්සත් ජනපද සහචරයෝ ඒ හා සමාන මෙහෙයුම් රඟදක්වා ඇත. ඇෆ්ගනිස්තානය තුල ජ්‍යෙෂ්ට විරෝධීය සටන්කරුවන් දඩයම් කිරීම පිලිබඳව ඕස්ට්‍රේලියානු එස්ඒඑස් භටයන්ව වොෂින්ටනයේ ඉහල ඇගයීමට ලක්වන අතර ජර්මානු හමුදා තලිබාන චරිත යයි සැකකෙරෙන අයව ඝාතනයේ නිරතව සිටිති. ඒ අනුව සලකන කල ඩුබායිහි දී සිදුවූ මහ්මුද් අල්-මබෞගේ ඝාතනයට දැක්වෙන තිල ප්‍රතිචාරය සමීප ශ්‍රේනිවල ජාත්‍යන්තර යුද අපරාධකරුවන්ගේ සභාගයක ස්වරූපය ගැනීම පුදුමයක් නො වේ.

ජාත්‍යන්තර නීතිය සහ ප්‍රජාතන්ත්‍ර අයිතීන් සම්බන්ධයෙන් ගත්කල ඩුබායි ඝාතනයේ දුරදිග යන ගම්‍යයන් පිලිබඳව සාකච්ඡාවක් නොමැති ය යන්න එක්සත් ජනපදයේ, යුරෝපයේ සහ ඕස්ට්‍රේලියාවේ ප්‍රධාන පක්ෂ හා මාධ්‍යවල පිරිහුනු දේශපාලනික සහ සදාචාරමය තත්වය ගැන තෙස්තමේන්තුවකි. සමහර විට ඝාතන ක්‍රියාන්විතය ඕනෑවාට වැඩියෙන් අහිතකර ප්‍රසිද්ධියක් ලබා ඇති ය යන්න සහ ඊස්රායල ආන්ඩුව එහි සහචර රටවලට අයත් ගමන් බලපත්‍ර ව්‍යාජව සකස් නො කල යුතු යන්නට අනුව කාංසාවල් පලවී තිබෙන්නේ හුදෙක් ම උපායාත්මක අර්ථයෙන් පමනි.

කෙසේ වෙතත් අනෙකුත් චර්චාකරුවෝ ඝාතනය සැමරූහ. පෙබරවාරි 18 දා ලන්ඩන්හි ටයිම්ස් වෙත ලියූ මෙලනී රීඩ් "කීමට තරම් නො යුතු වුවත් ඊස්රායලය දේවල් කරන ආකාරය පිලිබඳව මට සැලකිය යුතු ආසක්ත බවක් ඇත" යි ලිවීය. "ඔවුන්ට යමක් අවශ්‍ය ය, ඔවුහු එය ලබා ගනිති. යමෙක් තමන්ගේ මාරක සතුරෙක් ලෙස හඟින ඔවුහු ඔවුන්ව මරා දමති. ඔවුන්ට පහර වදින අතර ඔවුහු පෙරලා පහර දෙති. විස්තර කරමින් හෝ සාධාරනීකරනය කරමින් හෝ වේදනා විඳිමින් කාලය කා නො දමන ඔවුහු ඔවුන්ගේ සතුරන්ට ඔවුන්ගේ රටට ඇතුල් වී ත්‍යාගශීලී සුභසාධන භුක්ති විඳීමට ඉඩ නො දෙති. ඔවුහු නිකම් ම ක්‍රියාකරති. අවුල් කරගැනීමක් නැත. සදාචාරාත්මක තැකීමක් නැත.

උරහිස් සැලීමක් සහ ප්‍රතික්ෂේප කිරීමක් පවා නැත්තේ කිසිවක් විවාදයට ගැනීම විශිෂ්ට ලෙස ප්‍රතික්ෂේප කරමිනි.”

මහ්මුද් අල්-මභෞගේ ඝාතනය සහ එයට දැක්වී ඇති නිල ජාත්‍යන්තර ප්‍රතිචාරය දරුනු අනතුරු ඇඟවීමක් ලෙස ගත යුතු ය. එලඹෙන කාල පරිච්ඡේදයේ දී ජාත්‍යන්තර පරිමානව ආන්ඩු විසින් ඊනියා ඉලක්කගත ඝාතන මත වඩ වඩා රැඳී සිටිනු ඇත්තේ හුදෙක් ත්‍රස්තවාදී චෝදනා ලබන්නන්ට පමනක් නොව පවත්නා සමාජ සහ දේශපාලන පර්යායට අනතුරක් වන ඕනෑම පුද්ගලයෙකුට එරෙහිව ඒවා යොදා ගනිමිනි.

**පැට්රික් ඕ'කොනර්**

© www.wsws.org